# ප්‍රසම්පාදන දැන්වීමයි

## වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

## රාජ්‍ය දැව සංස්ථාව

## 2024 වර්ෂයට දැව සැපයීම හා මංසල මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන දැන්වීම

## සහ

## ඒ සඳහා නවක කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

## Vවන අදියර යටතේ නැවත ලංසු කැඳවීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයට පූර්ණ හෙළීම් වැඩසටහන යටතේ රාජ්‍ය දැව සංස්ථාව වෙත නිදහස් කරන ලද පහත දැක්වෙන ප්‍රාදේශිකයන්හි බෙදා වෙන් කරන ලද වැඩබිම් කොටස් වල දැව ගබඩා වෙත සපයා භාරදීම හා සංස්ථා නියමයන් පරිදි මාර්ගාසන්න ගබඩාවේ දී මිල දී ගැනීම සඳහා 2024 වර්ෂය සඳහා සංස්ථාවේ ලියාපදිංචි වී ඇති විශේෂ, A, B හා C ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. 2024 වර්ෂය සඳහා මෙතෙක් ලියාපදිංචි වී නොමැති දැව සැපයීම් සඳහා කැමැත්තක් දක්වන ශ්‍රී ලාංකික පුරවැසියන්ට රාජ්‍ය දැව සංස්ථාවේ C ශ්‍රේණිය යටතේ ලියාපදිංචි වී ඉහත ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් විය හැක.

| රාජ්‍ය දැව සංස්ථා ප්‍රාදේශිකය | නිදහස් කර ඇති වන වගාවල ප්‍රධාන දැව වර්ගය | බෙදා වෙන් කර ඇති වැඩබිම් ගණන |
|---|---|---|
| නුවරඑළිය | පයිනස් | 10 |
| මාතර | පයිනස් | 02 |
| රත්නපුර | පයිනස් | 22 |
| බණ්ඩාරවෙල | පයිනස් | 14 |
| මහනුවර | පයිනස් | 06 |

***සැ.යු. : කොන්ත්‍රාත් වටිනාකමින් 5% ක් වූ අවම කාර්යසාධන සුරක්ෂිත ඇප මුදලක් ජයග්‍රාහී කොන්ත්‍රාත්කරුවන් විසින් එක් එක් වැඩබිම් සඳහා තැන්පත් කළ යුතුය.***

ප්‍රසම්පාදන ලේඛන සහ අවශ්‍ය තොරතුරු හා අයදුම්පත් ලබා ගත හැකි කාර්යාල.

| කාර්යාලය | ලිපිනය | දුරකථන අංක |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | මෙහෙයුම් අංශය, රාජ්‍ය දැව සංස්ථාව, 82, රජමල්වත්ත පාර, | 011-2885854 |
| අනුරාධපුරය | රාජ්‍ය දැව සංස්ථාව, ගොඩගේ මාවත, අනුරාධපුරය. | 025-2222380 |
| අම්පාර | රාජ්‍ය දැව සංස්ථාව, එරගම පාර, අම්පාර. | 063-2222413 |
| කුරුණෑගල | රාජ්‍ය දැව සංස්ථාව, පොල්අත්තාපිටිය, කුරුණෑගල | 037-2222456 |
| කොළඹ | රාජ්‍ය දැව සංස්ථාව, කල්දෙමුල්ල | 011-2637179 |
| මහනුවර | රාජ්‍ය දැව සංස්ථාව, පල්ලෙකැලේ, මහනුවර. | 081-2421717 |
| බණ්ඩාරවෙල | රාජ්‍ය දැව සංස්ථාව, අංක 25, බිඳුනුවැව, බණ්ඩාරවෙල. | 057-2232478 |
| රත්නපුරය | රාජ්‍ය දැව සංස්ථාව, නව නගරය, රත්නපුරය. | 045-2228948 |
| යාපනය | රාජ්‍ය දැව සංස්ථාව, 25, ගුරුනගර්, යාපනය. | 021-2220278 |
| නුවරඑළිය | රාජ්‍ය දැව සංස්ථාව, ලේඩි මැකලම් පාර, නුවරඑළිය. | 052-2222533 |
| මාතර | රාජ්‍ය දැව සංස්ථාව, දුම්රිය බඩු ගබඩා පාර, මාතර. | 041-2222122 |

**<u>නව ලියාපදිංචිවීම</u>**

සුදුසුකම් සපුරාලනු ලබන අයදුම්කරුවන් විසින් නියමිත ලියාපදිංචි ගාස්තු මුදලින් ප්‍රධාන කාර්යාලයට ගෙවා ලබාගත් කුවිතාන්සිපත අයදුම්පත සමඟ ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් ලියාපදිංචි විය හැක. මෙම ලියාපදිංචිය වසරක් දක්වා වලංගු වන අතර ඉදිරි වර්ෂය සඳහා අවශ්‍ය නම් යාවත්කාලීන කරගත යුතුය.

**<u>අවශ්‍ය සුදුසුකම්</u>**

- ජාතික හැඳුනුම්පත හෝ රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය හා එහි ඡායා පිටපතක්
- ග්‍රාම නිලධාරි සහතිකය (පදිංචිය හා චරිතය සඳහන් කරන ලද)
- මුදලින් රු: 2000/- ක් ගෙවා ලබාගත් ලියාපදිංචි ගාස්තු කුවිතාන්සිපත
- 2'' x 2.5'' ඡායාරූප 02 ක් (මෑතකදී ලබාගත්)
- රු: 1,000,000/- කට නොඅඩු වටිනාකමකට ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් හෝ තමා සතු දේපලක් (චංචල හෝ නිශ්චල) ඇති බවට සහතිකයක් හා එහි ඡායා පිටපතක්

**<u>ප්‍රසම්පාදන ලංසු ඉදිරිපත් කිරීම</u>**

1. ප්‍රසම්පාදන ලේඛන පත් නියමිත ගාස්තු ගෙවීම් කර බත්තරමුල්ල, **"සම්පත්පාය"** හි පිහිටි රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් අංශයෙන් සහ දැව සංස්ථාවේ ඉහත සඳහන් ප්‍රාදේශීය කාර්යාල වලින් **2024.08.21** දින ප.ව. 03.00 දක්වා ලබා ගත හැක.

2. ප්‍රසම්පාදන ලේඛන භාර ගැනීම **2024.08.22** දින පෙ.ව. 10.00 ට අවසන් කරනු ලබන අතර එම අවස්ථාවේදීම ප්‍රසම්පාදන ලංසු විවෘත කරනු ලැබේ.

3. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන ලේඛනපත් මුද්‍රා තබා නියමිත වේලාවට හෝ ඊට ප්‍රථම එම වැඩබිමට අදාළ ප්‍රාදේශීය කාර්යාලයේ තබා ඇති ප්‍රසම්පාදන පෙට්ටියට බහාලීම හෝ **2024.08.22** දින පෙ.ව. 10.00 ට ප්‍රථම අදාළ ප්‍රාදේශීය කාර්යාල වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් එවීම හෝ කළ හැක.

මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වනු ඇත.

**සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී**
**රාජ්‍ය දැව සංස්ථාව**